

# සෑම දෙමව්පියෙකුගේම සිහිනය

# නිරෝගී දරු සම්පතක්



# ඔබගේ දරුවාට දිය හැකි උතුම්ම දායාදය නිරෝගී බවයි



# මව් පදවිය


- ප්‍රධාන අරමුණ සෞඛ්‍ය සම්පන්න නිරෝගී දරුවෙක් බිහි කිරීමයි.
- සමහර ආසාදනයන් ආසාදිත මවගෙන් දරුවාට බෝ වීමට හැකියාව ඇත.
- උදා: HIV ආසාදනය

  Syphilis ආසාදනය

# HIV ආසාදිත දරුවන්

දැනට පවතින දත්ත අනුව HIV ආසාදිත දරුවන් 78ක් පමණ වාර්තා වී ඇත. මෙය අපට මුහුණ දීමට තිබෙන ප්‍රධාන ප්‍රශ්න අතර එකකි.

# HIV ආසාදිත දරුවන්



# HIV ආසාදිත දරුවන්

- කොහොමද මේ දරුවන් ආසාදිත වුනේ?
  - මව තම ආසාදිත තත්වය නොදැන සිටීම
  - තමා ආසාදිත යැයි නොසිතීම
  - දරුවාට ආසාදනය වීම වැළක්වීම සඳහා ඇති සේවා ගැන නොදැන සිටීම


# මවට ආසාදනය ඇත්නම් දරුවාට රෝගය සෑදීමට ඉඩ ඇත.



# ආසාදිත මවගෙන් දරුවාට වැළඳෙන්නේ කෙසේද?

- ගර්භනී කාලයේදී
- දරු ප්‍රසූතියේදී





# වැදගත්කම

HIV රුධිර පරීක්ෂාව ගර්භයට සති 12 ට පෙර සිදු කරගන්න.

**ඔබේ කැමැත්ත අනුව සිදුකරගන්නා HIV පරීක්ෂාව ඔබේ බිළිඳාගේ නිරෝගී බව තහවුරු කරයි.**

HIV හඳුනා ගැනීමේ පරීක්ෂාවෙන් ලැබිය හැකි ප්‍රතිඵල

- (-) Negative
- (+) Positive

ඔබේ HIV හඳුනාගැනීමේ පරීක්ෂාව Negative නම්,

ඔබට HIV ආසාදනය නැත. ඔබේ දරුවා සුරක්ෂිතයි.

ඔබේ HIV හඳුනාගැනීමේ පරීක්ෂාවෙන් positive බව පෙන්නුම් කළ ද කලබල වෙන්න එපා.

HIV ආසාදිත තත්වය තහවුරු කිරීම සඳහා තවදුරටත් පරීක්ෂා කළ යුතුය.

ඔබට ආසාදනය ඇති බව තහවුරු වුවත්

ඔබ බිය විය යුතු නැත.

ඔබ තවමත් ප්‍රමාද නැත.

- HIV අසාදිත ගර්භනී මව්වරු සඳහාම වෙන් වූ සේවාවන් රැසක් ලිංගාශ්‍රිත රෝග සායන හා මාතෘ සායන වල ඇත.
- මවගේ රෝග තත්වය සම්පූර්ණයෙන්ම පාලනය කළ හැක.
- වෛද්‍ය උපදෙස් නිසියාකාරව අනුගමනය කිරීමෙන් HIV නොමැති නිරෝගී දරුවෙකු බිහි කළහැක.

මවගෙන් දරුවාට ආසාදනය වීමේ අවදානම මවගේ රුධිරයේ ඇති වෛරස ප්‍රමාණය මත රඳා පවතී.

HIV සඳහා ඇති ප්‍රතිවෛරස ඖෂධ මගින් රුධිරයේ වෛරස ප්‍රමාණය ඉතා අඩු මට්ටමකට ගෙන ආ හැක.

පහත පියවර සියල්ල පිළිපැදීමෙන් නිරෝගී දරුවෙකු බිහි කිරීමේ හැකියාව ඇත.



- ප්‍රතිවෛරස ඖෂධ මගින් මවගේ රුධිරයේ ඇති වෛරස ප්‍රමාණය අවම කර ගැනීම.

- ප්‍රසූතියේ අවදානම අවම කිරීම සඳහා අවශ්‍ය පියවර ගැනීම.

- තවදුරටත් සම්ප්‍රේෂණය අවම කිරීමට දරුවාට ප්‍රතිවෛරස ඖෂධ ලබා දීම.

- වසර 2011 ට පසු ආසාදිත ගර්භනී මව්වරුන් 50 කට වැඩි සංඛ්‍යාවකට මෙම සේවාවන් ලබා දී ඇත.
- ඒ සියළුම දරුවන් ආසාදනයෙන් තොර නිරෝගී දරුවන් බවට තහවුරු කර ඇත.

ඔබත් රජයෙන් නොමිලයේ ලැබෙන සේවාවන් ලබාගෙන නිරෝගී දරු සම්පතක් හිමි කරගන්න.

# උපදංශ රෝගය

උපදංශ රෝගයද මවගෙන් දරුවාට සම්ප්‍රේෂණය වන තවත් එක් රෝගයකි.

# සංජානනීය උපදංශය



- උපදංශ රෝගය නිසි ප්‍රතිකාර මගින් සම්පූර්ණයෙන්ම සුවකළ හැකි තත්වයකි.
- එහෙත් තවමත් සංජානනීය උපදංශය සහිත දරුවන් වසරක් පාසාම බිහි වේ.

මෙම රෝගය නිසි අවධියේ හඳුනා ගැනීම හා නිසි ප්‍රතිකාර මගින් සම්පූර්ණයෙන් සුව කළ හැකි රෝගයකි.



# මෙය වළක්වාගත හැක්කේ කෙසේද?

- ගර්භණී සමයේ සති දොළහට පෙර VDRL පරීක්ෂණය කිරීමෙන් මෙය හඳුනාගත හැක.

- ගර්භයට සති 24 වීමට පෙර මවට ප්‍රතිජීවක ඖෂධ ලබා දීමෙන් සංජානනීය උපදංශය දරුවාට වැළඳීම සම්පූර්ණයෙන් වළක්වා ගත හැක.

# මෙය වළක්වාගත හැක්කේ කෙසේද?

මව සහ සහකරු දෙදෙනාම නිවැරදි ප්‍රතිකාර ගැනීම ඉතා වැදගත්ය.



- මෙම රෝගය නිසි අවධියේ හඳුනාගැනීමෙන් නිට්ටාවටම සුව කළ හැකිය.
- අවශ්‍ය වන්නේ ඉක්මනින් හඳුනා ගැනීමයි.

HIV හා උපදංශ ආසාදනය සඳහා විශේෂ ප්‍රතිකාර සේවාවන් ලබා ගැනීමට වෛද්‍යවරු ඔබව ළඟම ඇති ලිංගාශ්‍රිත රෝග සායන වලට යොමු කරනු ඇත.

# ලිංගාශ්‍රිත රෝග සායනයේදී...

- ඔබට මේ සඳහා විශේෂිත පුහුණුවක් ලැබූ පළපුරුදු කාර්ය මණ්ඩලයක සුහදශීලී සේවාවක් ලබා ගත හැක.
- ඔබේ තොරතුරු වල රහස්‍යභාවය ආරක්ෂා කිරීමට අපගේ කාර්ය මණ්ඩලය බැඳී සිටියි.
- ඔබට අවශ්‍ය උපදේශන සේවා පහසුකම්ද ඇත.

ඔබ සහ ඔබේ කිරිකැටියා ආසාදනයෙන් වළක්වා ගැනීමට අප සමග අත්වැල් බැඳගන්න.



- මෙම ආසාදනය ගැන දැනුවත් වෙන්න.
- ඔබේ සහකරුද මේ ගැන දැනුවත් කරන්න.
- ඔබේ දරුවාට මෙම ආසාදනය සම්ප්‍රේෂණය වීම වැළක්වීමට හැකි සෑම උත්සාහයක්ම ගන්න.
- නිරෝගී දරුවෙකු ඇති ප්‍රීතිමත් මාපිය යුවලක් වන්න.

